

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

2022

වාර්ෂික කාර්යසාධන වාර්තාව

පටුන

01.	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය	05-37
02.	නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය	39-60
03.	කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය	61-78
04.	යටිතල පහසුකම් සංවර්ධන අංශය	79-103
05.	ක්‍රීඩා වෛද්‍ය ආයතනය	105-128
06.	ජාතික ක්‍රීඩා විද්‍යායතනය	129-148



ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

01. වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

1.1 හැඳින්වීම

අභිමානවත් තුලිත පෞරුෂත්වයකින් යුත් ජවසම්පන්න තරුණ ප්‍රජාවක් හා ජවසම්පන්න, නීරෝගීමත් සහ විනය ගරුක සමාජයක් බිහිකිරීම සඳහා ක්‍රියාශීලී පරපුරක් නිර්මාණය කිරීමට රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වන පරිදි හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුකූලව තරුණ ප්‍රජාව හා ක්‍රීඩාව කේන්ද්‍ර කරගනිමින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ කාර්යයන් සිදු කෙරේ. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය ලෙස පැවැති නාමය අංක 2289/43 දරණ හා 2022 ජූලි මස 22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය ලෙස සංශෝධනය විය.

1.2 දැක්ම මෙහෙවර

දැක්ම

‘ජවසම්පන්න තාරුණ්‍යය තුළින් තිරසර සංවර්ධිත දේශයක්’

මෙහෙවර

ජාතික ආර්ථිකයට සක්‍රියව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහිකිරීම හා විනය ගරුක, ක්‍රීඩාශීලී සමාජයක් තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැඟීමට දායක වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රීඩා හා යෞවන කටයුතු විෂයයන්ට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂයය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමණාකරන ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරි ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා ඝානුබලයන් සැපයීම.
- ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැඟීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර්ජාතික තරඟවලට සහභාගි වීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම.
- පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදුකිරීම.
- ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේදී තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියාකිරීම.
- ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමණාකරණය කිරීම.
- ක්‍රීඩා සමිති සංවිධානය සහ ක්‍රීඩා තරඟාවලි ප්‍රවර්ධනය කිරීම.
- තරුණ පරපුරේ අභිලාශයන් ඉටුවන ජාතික වැඩපිළිවෙලක් අරමුණු කරගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොට ගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු.
- තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලීත්වය සමාජ පිළිගැනීමක් ඇතිවන හා ඔවුනට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකිවන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම.
- දේශීය, විදේශීය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම.
- තරුණ ව්‍යවසායකයින් බිහිකිරීමට පියවර ගැනීම සහ ඔවුනට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු.
- අමාත්‍යාංශයට අනුබද්ධ සියළුම ආයතනයන් අධීක්ෂණය කිරීම.

1.4 සංවිධාන සටහන


ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
ලේකම්
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී (ගෙවීම්)
සං.නි.සේ
ක.සේ.නි
කා.සේ.සේ.
සං.නි.සේ
ක.සේ.නි
කා.සේ.සේ.
අතිරේක ලේකම් (පාලන සහ ප්‍රසම්පාදන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
සහකාර ලේකම් (ප්‍රසම්පාදන)
සහකාර ලේකම් (පාලන)
පරිපාලන නිලධාරී
ප්‍රවෘත්ති නිලධාරී
සං.නි.සේ
නිශ්චල කැමරා ශිල්පි/ වීඩියෝ කැමරා කියාකරු
කැමරා ක්‍රියාකරු සහයක
තො.තා.නි.
තො.තා. සහකාර
නිවාස පාලක
රියදුරු
කා.සේ.සේ.
භාෂා පරිවර්ථක
නීති නිලධාරී
සං.නි.සේ
ක.සේ.නි
කා.සේ.සේ.
අතිරේක ලේකම් (තරුණ කටයුතු)
ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම්
අධ්‍යක්ෂ (තරුණ)
සහකාර අධ්‍යක්ෂ
සං.නි.සේ
ක.සේ.නි
කා.සේ.සේ.
අතිරේක ලේකම් (සංවර්ධන)
අධ්‍යක්ෂ (සංවර්ධන) -2
සහකාර අධ්‍යක්ෂ (02)
සං.නි.සේ
ක.සේ.නි
කා.සේ.සේ.
අධ්‍යක්ෂ ක්‍රීඩා සහ සෞඛ්‍ය විද්‍යා පරීක්ෂණ
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
ඉංජිනේරු -3
කාර්මික නිලධාරී
කාර්මික සහකාර
සැලසුම් ශිල්පි
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) -2
සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) - 3
සං.නි.සේ
කා.සේ.සේ.
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක
සං.නි.සේ
ක.සේ.නි
කා.සේ.සේ

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ජාතික තරුණ සේවා සභාව
2. ජාතික යොවුන් සේනාංකය
3. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
4. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය
5. යටිතල පහසුකම් සංවර්ධන අංශය
6. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
7. ජාතික ක්‍රීඩා විද්‍යායතනය
8. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
9. උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

02. වන පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

2.1.1. සුවිශේෂී ජයග්‍රහණ

- 22 වන වරට එංගලන්තයේ බර්මින්හැම් නුවර පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උලෙළේ දී ලක් මාතාවට ලෝකඩ පදක්කම් 03 ක් සහ එක් රිදී පදක්කමක් වශයෙන් පදක්කම් 04 ක් දිනා දීමට ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් විය.

  මෙහි දී පැරා කවපෙත්ත විසිකිරීමේ තරඟ ඉසව්වේ මීටර් 44.20 ක දුරක් වාර්තා කරමින් ශ්‍රී ලංකා සැරයන් එච්.ජී.පාලිත බණ්ඩාර රිදී පදක්කම ද කෝප්‍රල් වයි.ඩී.අයි. කුමාර කි.ග්‍රෑ. 55 බර ඉසිලීමේ ඉසව්වෙන් කි.ග්‍රෑ 120 සහ කි.ග්‍රෑ 225 ක් උසුලමින් ලෝකඩ පදක්කම ද දිනා ගැනීමට සමත් විය.

  එමෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උලෙළේ දීම මීටර් 100 ධාවන ඉසව්වේ අවසන් තරගයේ දී යුපුන් අබේකෝන් තත්පර 10.14 කින් තරගය නිමාකරමින් ලෝකඩ පදක්කම හිමිකර ගැනීමට සමත් වූ අතර කි.ග්‍රෑ. 57 බර පන්තියෙන් මල්ලවපොර කාන්තා ඉසව්වට සහභාගී වූ නෙත්මි අභිංසා ලෝකඩ පදක්කම හිමිකර ගැනීමට සමත්විය.



එච්.ජී.පාලිත බණ්ඩාර



වයි.ඩී.අයි. කුමාර



යුපුන් අබේකෝන්



නෙත්මි අභිංසා

- 15 වෙනි වරට ඩුබායි සහ සාජා කේන්ද්‍රගතකොට පැවති ආසියානු කුසලාන ක්‍රිකට් තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීමට ශ්‍රී ලංකාව කණ්ඩායම සමත් විය.



ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම

- 2022 ආසියානු දැල්පන්දු ශූරතාවලිය රටවල් 11 ක සහභාගීත්වයෙන් සිංගප්පූරුවේ දී පැවති අතර ශ්‍රී ලාංකික දැල්පන්දු කණ්ඩායම සත්කාරක සිංගප්පූරු කණ්ඩායම 63-53 ක් වශයෙන් පරාජයට පත්කරමින් ජයග්‍රහණය කළේය.



ශ්‍රී ලංකා දැල්පන්දු කණ්ඩායම

- දකුණු ආසියානු කණිෂ්ඨ බැඩ්මින්ටන් ශූරතාවලියේ දී ශ්‍රී ලංකා බැඩ්මින්ටන් කණ්ඩායම රිදී පදක්කම් 04ක් සහ ලෝකඩ පදක්කම් අටක් දිනා ගැනීමට සමත් විය.



ශ්‍රී ලංකා බැඩ්මින්ටන් කණ්ඩායම

- ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය එක්ව "4 Nation International Foot ball Tournament" තරඟාවලිය පැවත්වීම.
- උසස් අධ්‍යාපන අවස්ථා සඳහා පුර්ණ ශිෂ්‍යත්ව 20ක් ලබා දීමට අදාළ අයදුම්පත් ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අයදුම්පත් ඇගයීම් කිරීම මගින් ශිෂ්‍යත්ව පිරිනැමීමට කටයුතු කිරීම.
- **SLTC වැඩසටහන**
  යොවුන් සේනාංකයේ සහ ජාතික තරුණ සේවා සභාවේ පරිගණක විද්‍යාගාර හරහා ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධි පාඨමාලාව (BAIT) ආරම්භ කරන ලදී.
- තරුණ කෘෂිකාර්මික සමාගම් - විරැකියාවෙන් පෙළෙන තරුණ ප්‍රජාවගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කොට ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා කෘෂි ව්‍යාපාරකත්වය පදනම් කරගත් විසඳුමක් ලබාදීමේ අරමුණින් දිස්ත්‍රික් 25 හි තරුණ කෘෂිකාර්මික සමාගම් පිහිටුවීමට බලාපොරොත්තු වේ. මෙහිදී නවීන තාක්ෂණය මත පදනම්ව කෘෂි ව්‍යාපාරකයන් බලගැන්වීම සඳහා අවශ්‍ය තාක්ෂණික, උපදේශන සහ මූල්‍ය සහාය ලබාදීම සිදුකරනු ලබයි. මේ වන විට දිස්ත්‍රික් 25 හි තරුණ කෘෂි සමාගම් 31 ක් (පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ සමාගම් 07 ක් ඇතුළුව) පිහිටුවා ඇති අතර එම සමාගම් ලියාපදිංචි කිරීමේ කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී.

2.1.2.මූල්‍ය හා භෞතික ප්‍රගතිය කෙරෙහි බල පෑ අභියෝග

- භාණ්ඩ හා සේවා වල අඛණ්ඩ මිල ඉහළයාම හා හිඟතාවය නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති වූ ගැටළු.
- ඉදිකිරීම් කොන්ත්‍රාත් - උපදේශන ආයතන ගැටළු.
- නිෂ්පාදන පිරිවැය හා ප්‍රවාහන වියදම් ඉහළයාම නිසා ව්‍යවසායකයන් මුහුණ දෙන ගැටළු.
- ආනයන සීමා හේතුවෙන් ව්‍යවසායකයින් මුහුණ දෙන අමුද්‍රව්‍ය හා තාක්ෂණික උපකරණ සම්බන්ධ සීමා කිරීම්.
- ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ මිල ඉහළයාම සහ හිඟතාවය නිසා ක්‍රීඩක ක්‍රීඩිකාවන් මුහුණ දෙන දුෂ්කරතා.
- අයවැය සීමා කිරීම නිසා පුර්ව සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ අවහිරතා.

2.1.3. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

අනු අංකය	වැඩසටහනේ නම	වෙන් කල ප්‍රතිපාදන (රු.මි.)	ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මි.)	2022.12.31 දිනට මුල්‍ය ප්‍රගතිය (රු.මි.)	2022.12.31 දිනට මුල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
01 02	194-2-4-1-2506 ක්‍රීඩා යටිතල පහසුකම් 194-2-4-1-2509 ක්‍රීඩා යටිතල පහසුකම්	100.5	40.5	19.8	49.5%	51%
03	194-2-4-19-2509 ක්‍රීඩා පහසුකම් සංවර්ධනය	102	-	25.1	-	✶

අනු අංකය	වැඩසටහනේ නම	වෙන් කල ප්‍රතිපාදන (රු.මි.)	ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මි.)	2022.12.31 දිනට මුල්‍ය ප්‍රගතිය (රු.මි.)	2022.12.31 දිනට මුල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
04	194-2-4-12-2401 පුහුණුකරුවන් සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන	1	-	-	-	✶
05	194-2-4-8-2104 දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා	100	50	26.05	52.1%	80%
06	194-2-4-18-2104 ක්‍රීඩා කෞතුකාගාරය	0.5	0.5	-	-	✶

✶

- ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන් පුහුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පුහුණු අවශ්‍යතා සහිත ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන් හඳුනා ගැනීමට කටයුතු කරන ලද අතර පුහුණුව ලබා දිය යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන පුහුණු වැඩසටහන සැලසුම් කලද වියදම් කළමණාකරණයට අදාලව නිකුත් වූ අයවැය චක්‍රලේඛ උපදෙස්වලට අනුව අදාල වැඩසටහන තාවකාලිකව අත්හිටුවන ලදී.
- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ගම්පහ ක්‍රීඩා සංකීර්ණයේ පොළව ලී අතුරා සංවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකා කබඩි සම්මේලනයට සිය ජාතික සංචිතය ස්ථාපිත කිරීමට අදාලව පහසුකම් සැලසීම සඳහා ප්‍රතිපාදන වෙන් කලද පැවති අර්බුදකාරී තත්වය හමුවේ අදාල කටයුතු සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය.
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් නාරාහේන්පිට කිරිමණ්ඩල මාවත පිහිටි භූමිය තුළ දුනු විදීමේ පිටියක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව මූලික සැලසුම් ශ්‍රී ලංකා දුනු විදීමේ සංගමය සමඟ ඒකාබද්ධව සිදු කළ අතර අදාල භූමිය වෙන් කිරීමේ දී ඇති වූ ප්‍රායෝගික ගැටළුවක් හේතුවෙන් හා වියදම් කලමණාකරණයට ලද උපදෙස් අනුව ව්‍යාපෘති අත්හිටුවීමට සිදුවිය.

2.2. ඉදිරි ඉලක්ක (2022 -2026)

- ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් තරුණ විරැකියාව පහත හෙළීම.
- දළ ජාතික නිෂ්පාදිතයට ක්‍රීඩා ආර්ථිකයේ දායකත්වය ඉහල නැංවීම.
- ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ ලබා ගත හැකි ක්‍රීඩා තරග සඳහා සහභාගිත්වය 25% කින් හා ඔලිම්පික් හා පොදු රාජ්‍ය මණ්ඩලීය පදක්කම් සංඛ්‍යාව 20 දක්වා වැඩි කිරීම.
- නිරෝගිමත් ජන සමාජයක් උදෙසා සෑම පුරවැසියෙක්ම ශාරීරික ක්‍රියාකාරකමකට හෝ ක්‍රීඩාවකට යොමු කිරීම.

.....
අමාත්‍ය ප්‍රධානියාගේ අත්සන

කේ. මහේසන්
ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
අංක.09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

03. වන පරිච්ඡේදය

2021.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

එෆිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තක්සේ 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එෆිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,227,390,000	1,392,141,000	එෆිඒ-3
-	නැන්පතු		31,943,102	7,584,476	එෆිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		39,917,795	26,025,477	එෆිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,299,250,897	1,425,750,954	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,299,250,897	1,425,750,954	
-	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		- -	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,299,250,897	1,425,750,954	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
1,008,383,991	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	917,206,869	741,405,153	එෆිඒ-
442,695,009	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	300,350,842	155,474,845	2(ii)
2,686,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,096,827,318	2,024,172,200	
	පොළී ගෙවීම්	8	-	-	
610,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	386,057	235,658	
4,138,189,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		3,314,771,086	2,921,287,856	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
125,085,000	වැඩිදියුණු කිරීම්	10	102,608,518	34,414,083	
287,200,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	164,207,094	231,793,177	
508,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	216,715,145	850,312,537	එෆිඒ- 2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
13,010,000	හැකියා වර්ධනය	14	12,903,219	4,727,958	
768,600,000	වෙනත් මූලධන වියදම්	15	295,033,229	624,087,467	
1,702,395,000	මුළු මූලධන වියදම් (උ)		791,467,205	1,745,335,221	
	නැන්පතු ගෙවීම්		69,112,844	20,357,225	එෆිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		67,550,362	28,936,737	එෆිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		136,663,206	49,293,961	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		4,242,901,497	4,715,917,038	
5,840,584,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(2,943,650,600)	(3,290,166,085)	
	අග්‍රිම සැපයුම් ප්‍රකාශය අනුව ශේෂය		(2,943,650,600)	(3,290,166,085)	එෆිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				එෆිඒ-3
			(2,943,650,600)	(3,290,166,085)	

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කණ්ඩායම 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,927,699,640	2,092,071,374
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	150,931,172	81,247,743
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		3,078,630,812	2,173,319,117
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		32,385,842	(30,101,242)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,927,699,640	2,092,071,374
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	42,050,862	
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	76,494,468	111,348,985
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		3,078,630,812	2,173,319,117

පිටු අංක.....1....සිට .....103... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...104..... සිට .....128.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2023/02/24	දිනය :	දිනය : 2023/02/24
කේ. මහේසන්		එස්.එන්. හපුආරච්චි
ලේකම්		ප්‍රධාන ගණකාධිකාරි
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය		තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක.09. පිලිප් ගුණවර්ධන මාවත,		අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.		කොළඹ 07

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒඑසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කණ්ඩායම	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	154,963,403	53,926,281
අග්‍රිම ලැබීම්	1,227,390,000	1,392,141,000
අත්තිකාරම් අයකර ගැනීම්	60,710,799	26,346,677
තැන්පතු ලැබීම්	30,894,183	7,472,366
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,473,958,386	1,479,886,325
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,174,988,753	877,370,491
සහනාධාර සහ මාරුකිරීම්	31,570,018	179,213,058
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	(177,740,254)	17,851,521
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	72,112,709	30,375,173
තැන්පතු ගෙවීම්	68,124,657	20,357,225
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,169,055,883	1,125,167,467
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	304,902,503	354,718,858
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	304,902,503	354,718,858
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	304,902,503	354,718,858
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(304,902,503)	(354,718,858)
		-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(0)	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය **(රු.,000)**

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම ඇස්තමේන්තු වේ % ලෙස
20020101	නිවාස කුලි	300	300	595.906	198%
2002.02.99		3,000	3,000	3198.431	106.6%
2003.02.99		75	50	384	768%
200303.02		5	-	-	-
2003.99.00		3,300	90,000	111764	124%
2004.01.00		-	-	34902	-
2006.02.01		-	-	4112	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

(රු.,000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	3,952,500	4,138,189	3,314,771	80.12%
ප්‍රාග්ධන	1,392,000	1,702,395	7,914,67	46.49%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව

වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල% ලෙස
		මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	වැටුප් ගෙවීමට1001	8,408,080.00	8,408,080.00	10,195,552.53	
විශ්‍රාම වැටුප්	ණය නිරවුල් කර ගැනීම සහ අධිභාර පියවා ගැනීම	3091862.42	3091862.42	3056862.42	
ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	1003			5,420,386.63	

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධන

වත්කම් නොවන	කේත විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	**31.12.2022** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	805,242,774.69	805,242,774.69	-	-
9152	යන්ත්‍රෝපකරණ	937,676,441.62	937,676,441.62	-	-
9153	ඉඩම්	300.00	300.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	476,120.00	476,120.00	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-0	-	-	-
9160	කෙරිගෙන යන වැඩ	1,184,304,004.04	1,184,304,004.04	-	-
9180	බදු දෙන ලද වත්කම්			-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එස්වයිඒ/ඒ/එම්එස්/2/22/01 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 ජූනි 30 දින

ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිලිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශ
2.2	වර්ෂ 02 සිට 07 දක්වා හා රු. 61,324,162 ක් වූ තැන්පතු 42 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 හි රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තවදුරටත් වාර්තා කලයුතු මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනා ගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයට ගිණුම් ගත කළ යුතු වුවද අමාත්‍යාංශය යටතේ ඇති දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා විද්‍යායතනය, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය සතු ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) නුවරඑළිය ක්‍රීඩා නිවහන පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.138,000,000 ක් වාසස්ථාන ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් ඉඩම්වල වටිනාකම අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන ක්‍රීඩා පාසල්, යෞවන හා ක්‍රීඩා සමාජ වෙත බෙදා දුන් රු. 10,223,641 ක් වූ ක්‍රීඩා භාණ්ඩ මූල්‍ය ප්‍රකාශනවල වත්කම්වලින් ඉවත්කර ඇතත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල රු.358,000,000 අගයකට ගිණුම් ගත කර ඇතත් එම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් 3ක වටිනාකම රු.300ක්වූ නාමික අගයකට CIGAS වැඩසටහනෙහි ඉඩම් ලෙස ගිණුම්ගත කර ඇතත් එම ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය සතු රු.මිලියන 04 කට තක්සේරු කර තිබුණ ලියාපදිංචි අංක 32-4805 දරන පෙජරෝ ජීප් රථය සහ පාපැදි 05 ක වටිනාකම CIGAS වත්කම් ලේඛනයේ රු. 100 බැගින් වූ වටිනාකමකට ඇතුලත් කර තිබුණු අතර තක්සේරු වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අමාත්‍යාංශය සතු වාහන 12 ක වටිනාකම වත්කම් ලේඛනයෙහි ඇතුලත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 කුලී වැඩ හා අත්තිකාරම් ගිණුම

අංක 250/2016 (i) හා 2016 අගෝස්තු මස 03 දිනැති රජයේ ගිණුම් වක්‍රලේඛයේ පරිදි අත්තිකාරම් සම්බන්ධයන් රජය සතු හිමිකම ජනරජ ගිණුමෙන් පෙන්නුම් කරන බැවින් ඒ සඳහා වන කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් ඒසිඒ 5 (ඒ) ආකෘතිය හා 5 (බී) ආකෘති මගින් දැක්විය යුතු වුවද, ව්‍යාපෘතියක් සඳහා ගෙවා තිබුණු රු. 9,627,030 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 4,727,831 ක මුදලක් අත්තිකාරම් ගිණුමේ දක්වා නොතිබුණු අතර ගිණුම් අංකයක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි.

1.6.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

නීති රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10.(ආ)	සැපයුම්කරු කොන්ත්‍රත්තුව ඉටු නොකිරීමෙන් අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගත වුවත් මාර්ගෝපදේශ ප්‍රකාරව රු.16,226,918 ක් වටිනා ක්‍රීඩා උපකරණ සැපයීම සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පුනරාවර්තන වැය විෂයයන් 10 ක එකතුව රු. 14,750,000 ක් වූ ප්‍රතිපාදන හා මූලධන වැය විෂයන් 10 ක එකතුව රු. 76,050,000 ක් වූ ප්‍රතිපාදන වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි. පුනරාවර්තන වැය විෂයයන් 55 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 24 කට අදාළව ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු පුනරාවර්තන ප්‍රදාන රු.552,238,717 ක් හා මූලධන ප්‍රදාන රු. 807,586,764 ක් බැගින් එකතුව රු. 1,359,825,481 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. ප්‍රතිපාදන ඉතිරීවීම් එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 97 දක්වා පරාසය තුල පැවැතුණ අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 03/2022 අයවැය වක්‍රලේඛයේ විධිවිධාන පරිදි වියදම් පාලනය කිරීම මේ සඳහා හේතු ලෙස දක්වා තිබුණි.

2.2 තැන්පතු

2022 දෙසැම්බර් 31 දිනට පැවති ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළව වර්ෂ 2 සිට 07 දක්වා කාලයක සිට තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇති රු. 61,324,162 ක් වූ තැන්පතු 42 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ අවසානයේ ලැයිස්තු පිළියෙල කර අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම

(i) රු.මිලියන 120.5 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන තිබුණු ව්‍යාපෘති 8 ක් ප්‍රාග්ධන අක්මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සහ වියදම් කළමණාකරණයට අදාලව නිකුත් වූ අංක 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි.

(ii) කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය ඉදිකිරීම සඳහා රු.12,423,487 ක් ඇස්තමේන්තු කර 2018 මාර්තු 28 දින රු. 12,230,761 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 6 කින් නිම කිරීමට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. ව්‍යාපෘතිය වර්ෂයක් හා මාස 08 කින් කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීම, ව්‍යාපෘති විෂයපථය සැලසුම් අදියරේදී හඳුනා නොගෙන කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් ඇස්තමේන්තුගත වටිනාකම 2019 වර්ෂයේදී සියයට 47 ක හා 2021 වර්ෂයේදී සියයට 54 ක දක්වා සංශෝධනය කර තිබීම, ඇස්තමේන්තු වැඩ වටිනාකම ඉක්මවා කටයුතු කිරීමේදී ව්‍යාපෘතියේ උපදේශක ලෙස කටයුතු කල කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අමතර වැඩ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් විධිමත් අනුමැතිය ලබා නොගෙන කටයුතු කිරීම, කඩිනමින් බෙරුම්කරණ ක්‍රියාවලියකට යොමු නොවීම, මිල විචලනය පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ ලබා දීමට වසරකට වඩා වැඩි කාලයක් ගත කිරීම හේතුවෙන් ගෙවිය යුතු මුදලව වඩා රු. 4,225,610 ක් (බදු සහිත) අමතරව ගෙවා තිබුණි. ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණු අතර පිටියේ නියමිත ප්‍රමිතියට අනුව තිබිය යුතු ඉඩ ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි. ව්‍යාපෘතියේ I වන අදියර පමණක් සිදුකර තිබුණ අතර දුනු විදීම හා වෙඩි තැබීමේ ක්‍රීඩා සඳහා ක්‍රීඩා පිටිය භාවිතා කළ නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගත නොහැකි වී තිබුණි.

(ආ) යටිතල පහසුකම් අංශය විසින් ඉටුකළ ව්‍යාපෘති

(i) ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම

ක්‍රීඩා සමාජ මෙන්ම ක්‍රීඩා කටයුතුවල යෙදෙන යෞවන සමාජ සමාජිකයන්ට සහ ක්‍රීඩා පාසල් සඳහා අවශ්‍ය වන ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර තිබුණ ද අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගත් පුද්ගලික සැපයුම් ආයතන 3ක් විසින් ගිවිසුම් ප්‍රකාරව එකතුව රු.30,029,475ක් වූ ක්‍රීඩා උපකරණ සපයා නොමැති බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි. ක්‍රීඩා සමාජවලට උපකරණ බෙදා දීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් වෙත ක්‍රීඩා උපකරණ ලබා දී තිබුණ අතර එම ක්‍රීඩා උපකරණ ක්‍රීඩා සමාජවලට බෙදා දුන් බව යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 14 ක් මගින් තහවුරු කිරීම් ලබා ගෙන නොතිබුණි.

(ii) මහජන ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන

මහජන ක්‍රීඩාපිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂයේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ හා බිල්පත් පියවීමට නොහැකි වූ ව්‍යාපෘති 09 ක් 2022 වර්ෂයේදී අවිච්ඡේද ව්‍යාපෘති ලෙස ආරම්භ කර තිබුණ අතර එය සඳහා රු. 33,458,228 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. රටෙහි පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැයට වඩා ව්‍යාපෘති වැඩ වටිනාකම ඉහළයාම හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර් ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීම

දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර් ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීමේ දී 2017 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 3,866 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන රු.මිලියන 606 ක් වියදම් කර තිබුණි. රු මිලියන 487 ක් වැය කර ඇති මීටර් 400 කෘතිම ධාවන පථයේ තරග සඳහා සහභාගී වන ක්‍රීඩකයින් අපහසුතාවයට පත්වන අයුරින් ස්ථාන කිහිපයක් පළුදු වී පැවතීම හා මන්තීරු වෙන් කරන ලද ඉරි මැකී ගොස් තිබුණි. ක්‍රීඩා සඳහා භාවිතා කල නොහැකි තත්වයේ පවතින පැරණි ධාවන පථය පිහිටි ප්‍රේක්ෂකාගාරයේ වහලය සුළං තත්ත්වයන් නිසා ගැලවී ගොස් තිබුණි. රු මිලියන 34 ක් වැය කර ඇති කුඩා ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් වුවද එහි ගිවිසුම අවලංගු කර තිබුණි. විදුලිජනක යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු මිලියන 30 ක් වැය කර සියයට 65 ක ඉදිකිරීම් ප්‍රගතියක් පැවතියදි ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර තිබුණි. මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීමේ කටයුතු රජයේ ඉදිකිරීමේ ආයතනයක් මගින් ඉදි කර ගැනීම සඳහා 2019 වර්ෂයේදී ගිවිසුමක් ඇති කර නොගෙන රු.මිලියන 5.4 ක් අත්තිකාරම් ලෙස ගෙවා ඇතත් එම ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ගෙවූ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යයන් ඉටු නොවීම හේතුවෙන් ආයෝජිත මුදලට අපේක්ෂිත ප්‍රතිලාභයක් අත්කර ගෙන නොතිබුණි.

4. **මානව සම්පත් කළමනාකරණය**

2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ එයට අයත් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය,නායකත්ව ජාතික මධ්‍යස්ථානය,ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය,ක්‍රීඩා වෛද්‍ය ආයතනය හා යටිතල පහසුකම් සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 29 ක් ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 59 ක්ද, ද්විතික මට්ටමේ පුරප්පාඩු 134 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 81 ක් ඇතුළු මුළු පුරප්පාඩු සංඛ්‍යාව 303 ක් පැවතුණි. මෙම පුරප්පාඩු තුළ අමාත්‍යාංශයේ කාර්යසාධනය කෙරෙහි බෙහෙවින් වැදගත්වන කාර්යමණ්ඩල ඌනතාවයන් පැවති අතර එයට අමතරව නායකත්ව සංවර්ධන ජාතික මධස්ථානයේ පුහුණු හා පර්යේෂණ සහකාර/සංවර්ධන තනතුරු 11ක් සහ කාර්යාල සහායක සේවයේ තනතුරු 2ක් අතිරික්තව පවතුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

4. වන පරිච්ඡේදය

කාර්ය සාධක දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධක දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස සත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
සාර්ථකව නිම කරන ලද ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය[1]	-	-	34.1%
අමාත්‍යාංශ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම	-	-	50%
අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම			40%

1 වියදම් කළමණාකරණයට අදාලව නිකුත් වූ අයවැය චක්‍රලේඛ උපදෙස්වලට අනුව හඳුනාගත් ව්‍යාපෘති/ වැඩසටහන් තාවකාලිකව අත්හිටුවන ලදී.

5. වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75%-100%
03. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම	2030 වනවිට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මගින් හෝ වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	සාර්ථකව නිම කරන ලද ක්‍රීඩා ප්‍රවර්ධන වැඩසටහන් (ක්‍රීඩා සතිය)	-	70%	-
04. පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	4.4. 2030 වනවිට සුනිසි රැකියාව සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තිය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම	ව්‍යවසායකත්ව, තාක්ෂණික හා වෘත්තිය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා සම්පූර්ණ කරන තරුණයින් සංඛ්‍යාව (වාර්ෂික ඉලක්කයෙන්)	-	100%	-

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකවින් විස්තර කරන්න.

6. වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	31	20	11
තෘතියික	04	02	02
ද්විතියික	190	142	48
ප්‍රාථමික	60	32	28
එකතුව	**285**	**196**	**89**

6.2 ** **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

මානව සම්පත හිඟවීම තුළ ආයතනයේ රාජකාරී කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායීව සිදුකිරීමට නොහැකි වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්) දේශීය	වැඩ සටහනේ ස්වභාවය දේශීය	නිමවුම/ලබා ගත් දැනුම
Advanced Certificate In Public Procurement and Asset Management	01	දින 10	30,000/-	දේශීය	Procurement and Asset Management
Diploma in English for Professionals (DEP)	01	මාස 03	75,000/-	දේශීය	English
ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධ උසස් ජාතික ඩිප්ලෝමා	01	දින 02	20,000/-	දේශීය	ප්‍රසම්පාදන
රාජ්‍ය ප්‍රසම්පාදන පුහුණු වැඩමුළුව (2022.03.30)	50	පැය 03	6000/-	දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදනය
රාජ්‍ය ප්‍රසම්පාදන පුහුණු වැඩමුළුව (2022.05.05)	55	පැය 03	6000/-	දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදනය
රාජ්‍ය ප්‍රසම්පාදන පුහුණු වැඩමුළුව (2022.08.29)	56	පැය 03	6000/-	දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදනය
මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන(2022.08.26)	32	පැය 03	-	දේශීය	මෘදු කුසලතා සංවර්ධන

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්) දේශීය	වැඩ සටහනේ ස්වභාවය දේශීය	නිමවුම/ලබා ගත් දැනුම
මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන(2022.09.09)	36	පැය 03	-	දේශීය	මෘදු කුසලතා සංවර්ධන
ජපන් පුහුණු වැඩසටහන	70	පැය 02	-	දේශීය	
කාර්යාල කාර්ය සහයක නිලධාරින්ට සත්කාරක පුහුණු පාඨමාලාව (නේවාසික)	08	දින 03	-	දේශීය	ආචාර ධර්ම
අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම	01	දින 02	8500/-	දේශීය	අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම
දෙමළ භාෂා පුහුණු වැඩසටහන	56	පැය 150	112,500/-	දේශීය	රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

07. වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිවරදි තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ වේ		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිවරදි කිරීණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මාදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂිකව සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර මෙවැනි අවස්ථා නැවත ඇති නොවීමට උපදෙස් ලබා දී ඇත.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිවරදි කිරීම් ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අදාළ නොවේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ	අක්‍රීය ගිණුම් නොමත	

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිවරදි කිරීම් ක්‍රියාමාර්ග
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අදාල වෙක්පත් හිමියන් විසින් බැංකුවට ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම නිසා	ප්‍රමාද වෙක්පත්, අගුරු වෙක්පත් සම්බන්ධව මු.රේ. අනුව කටයුතු කිරීම
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල නොවේ	2022 දෙසැම්බර් බිල්පත් ඉදිරිපත් වන්නේ ජනවාරි බැවින් සහ ලැබෙන සීමිත ප්‍රතිපාදන තුළ ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹී ඇත.	
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පර්යේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂයෙ, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිවරදි කිරීම් ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබයි	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබයි	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබයි	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දීඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		



ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය

1. පරිච්ඡේදය

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

2020.08.09 දිනැති හා අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද්දේ දිවයින පුරා ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත්, විශේෂයෙන් ක්‍රීඩා පාසල් ඇතුළුව අනෙකුත් පාසල් වලට අත්‍යාවශ්‍ය ක්‍රීඩා පහසුකම් සම්පාදනය කිරීමත් අරමුණු කරගෙනය.

2022 වසරේ අප්‍රේල් මාසය තුළ රට තුළ ඇති වූ ව්‍යාකූල තත්ත්වය මත සිදුකරන ලද අමාත්‍ය මණ්ඩල සංශෝධනය අනුව 2022.04.28 දින මෙම අමාත්‍යාංශය තරුණ හා ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යාංශය වශයෙන් නම් කර පැවැති කාර්යයන් හා කර්තව්‍යයන් ඒ පරිද්දෙන්ම පවරා දෙන ලදී. එහෙත් 2022.05.27 දිනැතිව නිකුත් කරන ලද අංක 2281/41 දරණ ගැසට් නිවේදනය මඟින් එතෙක් මෙම අමාත්‍යාංශයට පවරා දී තිබූ ආයතන හා කාර්යභාරයන් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත පවරා දෙන ලදී. 2022.09.08 දිනැතිව ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයෙකු පත් කරනු ලැබුවද, වෙනම රාජ්‍ය අමාත්‍යාංශයක් ස්ථාපනය නොකළ අතර පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය ලෙස ක්‍රියාත්මක වේ.

2022 සැප්-දෙසැ කාලසීමාව සඳහා ඉදිරිපත් කළ අතුරු අයවැය මඟින් එතෙක් රාජ්‍ය අමාත්‍යාංශයක් වශයෙන් හිමිව තිබූ වැය ශීර්ෂය ද ඉවත් කොට ප්‍රතිපාදන ලබා දීම ද ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සිදු කිරීමට කටයුතු කරන ලදී.කෙසේ වෙතත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ විශේෂ අනුමැතිය ප්‍රකාරව පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති ආයතන සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතුත්, පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කළ ව්‍යාපෘති කටයුතුත්, අවසන් කිරීම මෙම අංශය මඟින් සිදු කරන ලදී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

මෙහෙවර

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ දැක්ම,මෙහෙවර

අරමුණු

- ළමා හා තරුණ ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ගේ දැනුම,ආකල්ප හා කුසලතා වර්ධනයට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.
- පාසල් සිසුන්ගේ හා තරුණ ප්‍රජාවගේ නායකත්වය,පෞරුෂත්වය,විනය හා ජවසම්පන්න බව ප්‍රවර්ධනය කිරීම.
- නීරෝගීමත්,සෞඛ්‍ය සම්පන්න පරපුරක් බිහි කිරීම තුළින් රටේ සංවර්ධනයට කාර්යක්ෂම ලෙස දායක කර ගැනීම.
- ස්වයං විනයක් සහ ආධ්‍යාත්මික ගුණ වගාවක් සහිත පරපුරක් ප්‍රතිනිර්මාණය කිරීම.
- ක්‍රීඩාව තුළින් ශ්‍රී ලංකාව,ලෝකය ඉදිරියට ගෙනයන ක්‍රීඩාශීලී ජීවන රටාවකින් යුක්ත ළමා හා තරුණ පරපුරක් නිර්මාණය කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

මානව සම්පත් සංවර්ධනය

- ක්‍රීඩා පුහුණුකරුවන් ඇතුළු ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ සම්පත්දායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණය සම්බන්ධ ගැටළු හඳුනාගනිමින් ඒ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පැවැත්වීම.

යටිතල පහසුකම් සංවර්ධනය

- ක්‍රීඩා පාසල් වල යටිතල පහසුකම් සංවර්ධන කිරීම.
- ක්‍රීඩා උපකරණ බෙදා දීම.
- ග්‍රාමීය, පාසල් හා මහජන ක්‍රීඩා පිටිවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ක්‍රීඩා සම්බන්ධ දත්ත එක්රැස් කිරීම සඳහා ඩිජිටල් දත්ත පද්ධතියක් සකස් කිරීම.

1.4. සංවිධාන සටහන



සං.නි – සංවර්ධන නිලධාරි, තො.තා.ස - තොරතුරු තාක්ෂණය සහකාර, ක.සේ.නි – කළමනාකරණ සේවා නිලධාරි, තා.නි – තාක්ෂණික නිලධාරි

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

නැත

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන

නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේනම්)

නැත

2. පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හී ප්‍රගතිය

වැයශීර්ෂ අංක 13-02-194 යටතේ

1. මහියංගනය ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා වූ ශක්‍යතා අධ්‍යයනය
2. ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන
3. ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමේ වැඩසටහන
4. ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
5. යොවුන් සුවයට ක්‍රීඩාව වැඩසටහන
6. ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා විවිධ වැඩසටහන් සංවිධානය
7. ක්‍රීඩාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්
8. වෙනත්)සාම්ප්‍රදායික ජන ක්‍රීඩා සමාරම්භක සාකච්ඡාව හා ක්‍රීඩා සඟරාව බෙදා හැරීමේ මුද්දර ගාස්තු)

1. මහියංගනය ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා වූ ශක්‍යතා අධ්‍යයනය

රු.මි.200 ක ඇස්තමේන්තුවක් යටතේ මහියංගනය ප්‍රදේශයේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදි කිරීමට සැලසුම් කළ ද 03/2022 චක්‍රලේඛය යටතේ එම ව්‍යාපෘතිය අවලංගු කිරීමට සිදුවිය. එහි පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් වශයෙන් **පාංශු පරීක්ෂාවක්** පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් සිදු කරන ලදී.

2. ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන

මෑත කාලයේ මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රයේ පැවති පසුබෑමට විසඳුමක් ලෙස ක්‍රීඩා පාසල් තුළින් බිහිවන දක්ෂතා සහිත සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම කෙරෙහි රජයේ අවධානය යොමු වූ අතර ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම්කර ඇති ක්‍රීඩා පාසල් 30 අතරින් 2022 වසර තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් සංවර්ධනය කළ යුතු පාසල් 14 ක් ප්‍රමුඛතා පදනම මත අධ්‍යාපන අමාත්‍යාංශයේ ද සහයෝගය ඇතිව තෝරා ගන්නා ලදී.

එසේ තෝරා ගන්නා ලද ක්‍රීඩා පාසල් සඳහා මෙම අංශය විසින් 2022 වර්ෂයේදී රු.මි 300ක ප්‍රතිපාදන වෙන් කළ අතර එම පාසල්වල නේවාසිකාගාරවල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු මෙන්ම ක්‍රීඩා පිටිවල සංවර්ධන කටයුතු හා වෙනත් අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු මෙම වැඩසටහන යටතේ සිදු කරන ලදී.

2022 වර්ෂයේ සංවර්ධන කටයුතු සිදු කරන ලද **ක්‍රීඩා පාසල්**

පාසලේ නම
1. මාතලේ අකුරම්බොඩ මධ්‍ය මහා විද්‍යාලය
2. බදුල්ල වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලය
3. කොළඹ හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය
4. ගම්පහ හේනේගම මධ්‍ය විද්‍යාලය
5. අනුරාධපුර මධ්‍ය විද්‍යාලය
6. පොලොන්නරුව රාජකීය මධ්‍ය මහා විද්‍යාලය,
7. අම්පාර ඩී එස් සේනානායක මධ්‍ය මහා විද්‍යාලය
8. ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලය
9. මාතර දික්වැල්ල විජිත විද්‍යාලය
10. මන්නාරම මුරුන්කන් මහා විද්‍යාලය
11. යාපනය මධ්‍ය මහා විද්‍යාලය
12 .නුවරඑළිය පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය
13. කුරුණෑගල ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලය
14. කොළඹ රත්මලාන හින්දු විද්‍යාලය





පොළොන්නරුව රාජකීය විද්‍යාලය









මාතර දික්වැල්ල විජිත විද්‍යාලය









නුවරඑළිය පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය

3. ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම

මෙරට ක්‍රියාත්මක වන ක්‍රීඩා සමාජ මෙන්ම ක්‍රීඩා කටයුතුවල යෙදෙන යෞවන සමාජ සාමාජිකයින්ට සහ ක්‍රීඩා පාසල් සඳහා අවශ්‍ය වන ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කරන ලද අතර අයවැය චක්‍රලේඛ අංක 03/2022 යටතේ,මෙම මිලදී ගැනීම් අතරමඟ නවතා තබන ලදී. නමුත් ඒ වන විට විධිමත් ප්‍රසම්පාදන කටයුතු අවසන් කර තිබූ රු.මි. 18.575 ම අදාළ ක්‍රීඩා උපකරණ ක්‍රීඩා පාසල් වෙත ද දිස්ත්‍රික්ක 25 හි ක්‍රියාකාරී ක්‍රීඩා සමාජ හා යෞවන සමාජ වෙත ද, බෙදා දෙන ලදී.

4. ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම

විධිමත් දත්ත හා තොරතුරු මත පදනම් වී සංවර්ධන සැලසුම්කරණයේ යෙදීම අරමුණු කරගෙන භූගෝලීය අවකාශමය දත්ත පද්ධතියක් සකස් කිරීම 2021 වර්ෂයේ තුන්වන කාර්තුවේ ආරම්භ කරන ලද අතර එහි මූලික අදියර අවසන්ව පළමු බිල්පත ගෙවා ඇත .එම ඩිජිටල් දත්ත පද්ධතිය සඳහා ජංගම දුරකථන යෙදවුමක් හරහා ප්‍රාදේශීය මට්ටමේ දත්ත එක් රැස් කර ගැනීමට ද සැලසුම් කර ඇත.

5. "යොවුන් සුවයට ක්‍රීඩාව" වැඩසටහන

ක්‍රීඩාවේ අධ්‍යාත්මික සුවය පිළිබඳව ක්‍රීඩක ක්‍රීඩිකාවන්, යෞවන සමාජ හා ක්‍රීඩා සමාජ සාමාජිකයින් දැනුවත් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද මෙම වැඩසටහනේ නියමු වැඩසටහනක් ලෙස ජාතික තරුණ සේවා සභාවේ ජාතික සම්මේලනයේ දිස්ත්‍රික් නියෝජිතයින් සඳහා දින 2ක නේවාසික වැඩමුළුවක් ජයවර්ධනපුර සරසවියේ මහාචාර්ය ඥාණදාස පෙරේරා මහතා ඇතුළු විද්වතුන්ගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදී.





6. ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා විවිධ වැඩසටහන් සංවිධානය

ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් ක්‍රිකට් ක්‍රීඩා තරඟාවලි 02ක් පවත්වන ලදි.







7. ක්‍රීඩාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙන්ම පුහුණුකරුවන් හා පාසල් වල ක්‍රීඩා ගුරුවරුන් ක්‍රීඩාවේ නව දැනුමෙන් යාවත්කාලීන කිරීමේ අරමුණින් දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වන ලදි.

වැයශීර්ෂ අංක 194-02-04-19-2509 යටතේ

1. ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන
2. පාසල් ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන
3. මහජන ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන
4. ගම සමඟ පිළිසඳර /විශේෂ අවශ්‍යතා මත හඳුනා ගන්නා ක්‍රීඩා පහසුකම් සංවර්ධනය
5. ප්‍රාදේශිය ක්‍රීඩා තරඟ

1. ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන

2021 වර්ෂය ආරම්භ කරන ලද සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක් ක්‍රීඩාංගණය බැගින් ක්‍රීඩාපිටි 334ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ, 2021 වර්ෂයේ අර්ධ වශයෙන් නිම කරන ලද ව්‍යාපෘති හා බිල් ගෙවා අවසන් නොවූ ව්‍යාපෘති 2022 වසරේ අවිච්ඡේද ව්‍යාපෘති ලෙස ඉදිරියට ගෙන ගිය අතර එම ව්‍යාපෘති 42 හිම වැඩ අවසන් කර, බිල්පත් ගෙවීම් කටයුතු ද අවසන් කර ඇත.



මන්නාරම - කයානගර් අත්පන්දු ක්‍රීඩාංගණය





කන්ඩල - ශ්‍ර. ඇන්තනී අත්පන්දු ක්‍රීඩාංගණය

2. පාසල් ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන

2021 වර්ෂය ආරම්භ කරන ලද දිවයිනේ සෑම අධ්‍යාපන කලාපයකටම එක් පාසල් ක්‍රීඩාංගනයක් බැගින් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂයේ වැඩ නිම කිරීමට නොහැකි වූ හා බිල්පත් ගෙවා අවසන් නොවූ ව්‍යාපෘති 2022 වර්ෂයට ගෙන යන ලදී .එහිදී සංවර්ධනය කිරීමට සැලසුම් කරන ලද පාසල් ක්‍රීඩාපිටි 30 හි ම වැඩ අවසන් කර ඇත.



මොනාරාගල-මහා මාත්‍ය විද්‍යාල



මොනාරාගල-සෙවනගල විද්‍යාල ක්‍රීඩාපිටිය



බදුල්ල - විහාරමහාදේවි විද්‍යාල ක්‍රීඩාපිටිය



බදුල්ල -ඔරුබැදිවැව මහා විද්‍යාල ක්‍රීඩාපිටිය

3. මහජන ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන

2021 වර්ෂයේ ආරම්භ කරන ලද මහජන ක්‍රීඩා පිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ හා බිල්පත් පියවීමට නොහැකි වූ ව්‍යාපෘති 2022 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති ලෙස ආරම්භ විය .එම ව්‍යාපෘති 85 අතරින් ක්‍රීඩා පිටි 69 ක වැඩ අවසන් වී ඇති අතර ව්‍යාපෘති 7 ක වැඩ අවසන් අදියරේ පවතී.ව්‍යාපෘති 9 ක් ක්‍රියාත්මක නොවුණි.





කුරුණෑගල වීරමුණෙදර විද්‍යාලය

4. ගම සමඟ පිළිසඳර /විශේෂ අවශ්‍යතා මත හඳුනා ගන්නා ක්‍රීඩා පහසුකම් සංවර්ධනය

හිටපු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව 2021 වර්ෂයේ ක්‍රියාත්මක වූ "ගම සමඟ පිළිසඳර" වැඩසටහන හා සමාජීය වශයෙන් දැඩි දුෂ්කරතා සහිත ප්‍රදේශ වලින් ලද ඉල්ලීම් අනුව අති දුෂ්කර ප්‍රදේශවල ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර අවසන් කර ගත නොහැකි වූ ව්‍යාපෘති 2022 වසරේ අවිච්ඡේද ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක වූ අතර එම ව්‍යාපෘති 35ක් අතරින් 34 ක වැඩ සාර්ථකව අවසන් කර ඇති අතර එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවුණි.

5. ප්‍රාදේශිය ක්‍රීඩා තරඟ

මාතලේ දිස්ත්‍රික්කයේ පවත්වන ලද අත්පන්දු තරඟාවලියක් සඳහා අමාත්‍යාංශය විසින් අනුග්‍රාහකත්වය ලබා දී ඇත.

2.2 අභියෝග

- රට තුළ උද්ගත වූ අර්බුදකාරී තත්ත්වය හමුවේ වරින් වර සීමි කළ වියදම් සීමා කිරීම් නිසා සැලසුම් කළ වැඩසටහන් බොහොමයක් අවලංගු කිරීමට සිදු විය.
- ඉන්ධන හා අමු ද්‍රව්‍ය හිඟය නිසා ව්‍යාපෘතිවල කටයුතු නිම කිරීමට අපේක්ෂිත කාලයට වඩා කාලයක් ගත විය.
- පැවති ආනයන තහනම නිසා ක්‍රීඩා භාණ්ඩ හා වෙනත් සමහර අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දුෂ්කරතාවය
- ප්‍රවාහන අපහසුකම්, ඉන්ධන හිඟ වීම ආදිය මත ආයතනයේ නිලධාරීන්ට සේවය සඳහා පැමිණීමේ දී ඇති වූ දුෂ්කරතා.

2.3 අනාගත අරමුණු

- ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය හරහා කාර්යබහුල ජීවිතයට හුරු වූ ජනතාවගේ මානසික නිදහස උදෙසා ක්‍රීඩාව අස්වැසිල්ලක් කරවීම හා නිරෝගී ජවසම්පන්න පරපුරක් නිර්මාණය කිරීම.

- ක්‍රීඩා පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය තුළින් සිසු සිසුවියන්ගේ ක්‍රීඩා කෞශල්‍ය දියුණු කිරීම හරහා ඔවුන් ජාත්‍යන්තර තලය වෙත ගෙන ඒම.

- ග්‍රාමීය හා දුෂ්කර පාසල් සහ ක්‍රීඩා පාසල් ආශ්‍රිත ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් දක්ෂතා ඇති දරුවන්ට අවස්ථාව ලබාදීම හා පාසල් අධ්‍යාපනය හැර යන සිසුන් නොමඟට යොමුවීම අවම කිරීම.

- දක්ෂතා සහිත දරුවන්ගේ ක්‍රීඩා අවශ්‍යතා හඳුනාගෙන ඔවුන් සඳහා පහසුකම් සැපයීම තුළින් ඔවුන්ගේ ක්‍රීඩා දිවිය සාර්ථක කරගනිමින් ජාත්‍යන්තර ක්‍රීඩා ලොව ජය ගැනීමට අවශ්‍ය පසුබිම සකසා දීම.

.....

ආයතන ප්‍රධානී

නම්:

තනතුර:

දිනය: 17/02/2023

ඩබ්. ඒ. කුලසූරිය
අතිරේක ලේකම් (පාලන)
ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
12 වන මහල, බටහිර කුලුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

3. පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

අමාත්‍යාංශයේ ගිණුම තුළ ඇතුළත් වේ.

4. පරිච්ඡේදය

කාර්යසාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
අමාත්‍යාංශය මඟින් ලබාදිය යුතු වාර්තා නියමිත දිනට ලබා දීම (ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ඇස්තමේන්තු, අභ්‍යන්තර විගණන සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම)	✓		
ක්‍රීඩා පාසල් ආශ්‍රිත සංවර්ධන කටයුතු නිම කිරීමේ සමස්ත ප්‍රතිශතය	✓		
ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධන කටයුතු නිම කිරීමේ සමස්ත ප්‍රතිශතය	✓		
පාසල් ක්‍රීඩාංගන සංවර්ධනය කටයුතු නිම කිරීමේ සමස්ත ප්‍රතිශතය	✓		
මහජනන ක්‍රීඩාංගන සංවර්ධන කටයුතු නිම කිරීමේ සමස්ත ප්‍රතිශතය	✓		
ක්‍රීඩා උපකරණ සැපයීමේ සමස්ත ප්‍රතිශතය			✓
ගම සමඟ පිළිසඳර වැඩසටහන/අති දුෂ්කර/විශේෂ අවශ්‍යතා මත හඳුනා ගන්නා ලද ව්‍යාපෘතින්හි සංවර්ධන කටයුතු නිම කිරීමේ සමස්ත ප්‍රතිශතය	✓		

5. පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% -74%	75%-100%
03 නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධන ප්‍රවර්ධනය කිරීම	**3.1** දිවයිනේ තෝරාගත් ක්‍රීඩා පාසල් 14ක සංවර්ධන කටයුතු කිරීම මඟින් එකී පාසල්වල දරුවන්ගේ ක්‍රීඩා හැකියා ඉහළ නැංවීම.	සංවර්ධන කටයුතු නිම කිරීමේ ප්‍රගතිය			✓
	3.2 අවශ්‍යතාවය මත හඳුනා ගන්නා ලද පාසල් ක්‍රීඩාපිටි වල ක්‍රීඩා පහසුකම් සංවර්ධනය මඟින් දරුවන්ගේ ක්‍රීඩා හැකියාවන්ට පහසුකම් සැලසීම	සංවර්ධන කටයුතු නිම කිරීමේ ප්‍රගතිය			✓
	3.3 මහජන ක්‍රීඩා පිටි හා වෙනත් ක්‍රීඩා පිටි සංවර්ධනය තුළින් ජනතාවට ක්‍රීඩාව සඳහා පහසු ප්‍රවේශයක් ඇති කිරීම.	සංවර්ධන කටයුතු නිම කිරීමේ ප්‍රගතිය			✓

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් ක්‍රීඩාව සඳහා වන සෘජු නොවන නමුත් වක්‍ර වශයෙන් සම්බන්ධ වන 03 වන තිරසර සංවර්ධන අභිමතාර්ථය හා ඊට අදාලව ඉලක්ක හඳුනාගෙන ඇත. මෙම අමාත්‍යාංශය මඟින් අත්කරගනු ලබන ජයග්‍රහණ තුළින් තිරසර සංවර්ධනය කෙරෙහි වන බලපෑම වක්‍රාකාර වන නිසාත්, වෙනත් ආයතන කිහිපයක් ඒ සඳහා සෘජුව හා වක්‍රව සම්බන්ධ වන නිසාත් ජයග්‍රහණ දර්ශක මෙන්ම ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය ද ප්‍රතිශත දත්ත වශයෙන් නිර්ණය කිරීම අභියෝගයකි.

6. පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඌනතා/(අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	18	13	05
තෘතීයික	04	-	04
ද්විතීයික	70	57	13
ප්‍රාථමික	19	15	04

6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මානව සම්පත් හිඟය ආයතනයේ කාර්යක්ෂමතාවය අඩු වීමට සෘජුවම බලපාන කරුණක් බැවින් පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට දැනටමත් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
ලිපිගොනුකරණය සහ ආයතන සංග්‍රහය	46	2022.02.01	රු.2,400	-	දේශීය - පළමු කාර්තුව	ලිපිගොනු නිවැරදිව පවත්වා ගැනීම ලිපිගොනු ගත කරන ක්‍රම
මුදල් රෙගුලාසි	44	2022.02.02	රු.2,400	-	දේශීය - පළමු කාර්තුව	රාජ්‍ය මුදල් කළමණාකරණය පිළිබඳ දැනුම සහ නීතිමය රාමුව
මුදල් රෙගුලාසි	32	2022.02.07	රු.2,400	-	දේශීය - පළමු කාර්තුව	රාජ්‍ය මුදල් කළමණාකරණය පිළිබඳ දැනුම සහ නීතිමය රාමුව
ලිපිගොනුකරණය සහ ආයතන සංග්‍රහය	35	2022.02.24	රු.2,400	-	දේශීය - පළමු කාර්තුව	ලිපිගොනු නිවැරදිව පවත්වා ගැනීම ලිපිගොනු ගත කරන ක්‍රම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සැකසීම	1	2022.03.04	රු. 5,000	-	දේශීය - පළමු කාර්තුව	රජය ආයතන වල සියළුම වැටුප් පිළිබඳව අවබෝධය වර්ධනය කිරීම තුළින් ආයතනික කටයුතු නිවැරැදිව පවත්වාගෙන යාම
සහයක කාර්ය මණ්ඩල සඳහා ප්‍රසම්පාදන	2	2022.03.08, 09	(රු.1,0000 *2 = රු.2,0000)	-	දේශීය - පළමු කාර්තුව	නීතිමය රාමුව තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ මූලික දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
ක්‍රියාවලිය						
රජයේ වාහන නඩත්තුව	1	2022.03.15	රු.5,000	-	දේශීය - පළමු කාර්තුව	රජය සතු වාහන උපරිම කාර්යක්ෂමතාවයකින් හා අවම පිරිවැයකින් යුතුව පරිහරණය කිරිමට සහ ඒවායේ ආරක්ෂාව උපරිම අයුරින් සැලසෙන පරිදි කටයුතු කිරීමේ දැනුම
Transition to Euro codes (for engineer)	1	2022.03.05 - 26	රු.25,000	-		
පැය 150 දෙවන භාෂා පාඨමාලාව (ද්විතීයික)	48	2022.අප්‍රේල් මස සිට	රු112,500	-	දේශීය - පළමු කාර්තුව	රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගැනීම හා ජාතික සමගිය පිළිබඳ යහපත් ආකල්පයන් වර්ධනය කිරීම
පැය 100 දෙවන භාෂා පාඨමාලාව (ප්‍රාථමික)	36	2022.අප්‍රේල් මස	රු. 75,000	-	දේශීය - පළමු කාර්තුව	රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගැනීම හා ජාතික සමගිය පිළිබඳ යහපත් ආකල්පයන් වර්ධනය කිරීම
ගබඩාකරණය	1	2022.05.18, 19,20	රු. 18,000	-	දේශීය - දෙවන කාර්තුව	විශේෂිත ගබඩාකරණය පිළිබඳ දැනුම සහ අවබෝධය ලබා ගැනීම
ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු මඟින් සිදුවන දුර්වලතා හා ප්‍රමාදයන් අවම කර ගැනීම	1	2022.05.26, 27	රු. 10,000	-	දේශීය - දෙවන කාර්තුව	ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු මඟින් සිදුවන දුර්වලතායන් පිළිබඳ දැනුම
පැය 200 දෙවන භාෂා පාඨමාලාව	2	2022.06.24 – 2022.08.19	රු. 30,000	-	දේශීය - දෙවන කාර්තුව	රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගැනීම හා ජාතික සමගිය පිළිබඳ යහපත් ආකල්පයන් වර්ධනය කිරීම
රජයේ වාහන නඩත්තුව	1	2022.06.16	රු. 5,000	-	දේශීය - දෙවන කාර්තුව	රජය සතු වාහන උපරිම කාර්යක්ෂමතාවයකින් හා අවම පිරිවැයකින් යුතුව පරිහරණය කිරිමට සහ ඒවායේ ආරක්ෂාව උපරිම අයුරින් සැලසෙන පරිදි කටයුතු කිරීසමේ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
කාර්යාල කාර්ය සහයක සේවයේ රාජකාරී පුහුණුව	1	2022.06.21, 22	රු. 10,000	-	දේශීය - දෙවන කාර්තුව	කාර්යාල කාර්ය සහයක සේවයේ රාජකාරී කිරීමේ දී අවශ්‍ය දැනුම
පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම	1	2022.06.29	රු. 5,000	-	දේශීය - දෙවන කාර්තුව	පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම
රියදුරන්ගේ කුසලතා සංවර්ධන සංවර්ධන පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව	3	2022.08.23, 24	රු.30,000	-	දේශීය - තුන්වන කාර්තුව	නිවැරැදිව රජයේ නීතිරීති අනුව, ධාවන සටහන් ලිවීම සහ වාහනය නිසිපරිදි නඩත්තු කිරීමට අවශ්‍ය දැනුම
Digital Gov Activation Forum XII	3	2022.08.16, 18,19	නොමිලේ	-	දේශීය - තුන්වන කාර්තුව	
Internal Auditing Practices	2	2022.08.23, 24,25	රු.36,000	-	දේශීය - තුන්වන කාර්තුව	
රාජ්‍ය ප්‍රසම්පාදනය සම්බන්ධ පුහුණු වැඩමුළුව	10	2022.08.29	නොමිලේ	-	දේශීය - තුන්වන කාර්තුව	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ නීතිමය රාමුව සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ මූලික දැනුම
Google පැකේජය පිළිබඳ පුහුණු වැඩමුළුව	6	2022.08.25	නොමිලේ	-		
විගණන විමසුම් සඳහා සැපයීම දෙදින පුහුණු වැඩමුළුව	1	2022.11.21	රු.10,000	-	දේශීය - සිවිවන කාර්තුව	විගණයන්හි ප්‍රතිඵලයක් ලෙස මතු කරනු ලබන විමසුම් වලට නිවැරැදිව හා පිළිගත හැකි පිළිතුරු සකසන අයුරු පිළිබඳ දැනුම

*** ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

- පුහුණු වැඩසටහන් තුලින් ලබා ගන්නා දැනුම හා කුසලතාවය ආයතනයේ කාර්යක්ෂමතාවය සඳහා වැදගත් වේ.
- නවක නිලධාරීන්ගේ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය වීම තුලින් ඔවුන් රාජ්‍ය සේවයේ ආරම්භයේ පටන් නිවැරැදි මාර්ගයකට යොමු වීම පුහුණු වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක.

7. පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාර ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.1	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විභණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම			
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම් වලට එලඹීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම			
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		



ක්‍රීඩා වෛද්‍ය ආයතනය

01. පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික නිරෝගී බව පවත්වාගෙන යාම සඳහාත්, ඔවුන්ගේ රෝග නිවාරණය, ආබාධ කළමනාකරණය සහ නිවැරදි පෝෂණයන් පවත්වාගෙන යාම සඳහාත්, පිහිටුවා ඇති ආයතනය ක්‍රීඩා වෛද්‍ය ආයතනයයි. වෛද්‍ය ඒකකයක් ලෙස ආරම්භ වූ මෙම ආයතනය 2006 වර්ෂයේ සිට ක්‍රීඩා වෛද්‍ය ආයතනය ලෙස විධිමත්ව පවත්වාගෙන යනු ලබන අතර පාසල් මට්ටමේ සිට හඳුනාගන්නා දක්ෂතා සහිත දරුවන් ජවසම්පන්න නිරෝගී ක්‍රීඩකයන් ලොවට දායාද කිරීමටත්, ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ මෙරටට අත්කර ගැනීමටත්, මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සියළු වෛද්‍ය ආවරණයන් සැපයීමටත් නිරන්තරව කැප වී සිටී.

බාහිර රෝගී අංශය, විශේෂඥ වෛද්‍ය සායන, මානසික උපදේශන අංශය, හදිසි ප්‍රතිකාර අංශය, පුනරුත්ථාපන අංශය, රාසායනාගාරය, පෝෂණ අංශය, කායික යෝග්‍යතා හා VO2 max පරීක්ෂණ අංශය, ඖෂධ සැපයුම් අංශය හා ජෛව රසායන අංශය ලෙස වෙන්කර ඒ තුළින් සේවාවන් සපයන් ලබන අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිරතවූවන් දැනුවත් කිරීම සඳහා ක්‍රීඩා වෛද්‍ය උපදේශන සේවා සැපයීම ද භෞත චිකිත්සක හා ක්‍රීඩා සම්භාහක පාඨමාලා පැවැත්වීම ද ක්‍රීඩාවේ දියුණුව උදෙසා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද සිදුකරනු ලබයි.

ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ සමඟ ක්‍රීඩාවේ ජවසම්පන්න බව, විශිෂ්ඨත්වය හා ක්‍රියාශීලීත්වය මනාව රැකගැනීම සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත උසස් තත්වයේ සේවාවන් සැපයීම සිදුවන අතර ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ක්‍රීඩා විද්‍යා පර්යේෂණ සිදුකිරීම හා ලොව දියුණු රටවල භවිත වන නවීන ක්‍රීඩා තාක්ෂණය මෙරට තුළ යොදා ගැනීමෙන් ක්‍රීඩාවේ ජාත්‍යන්තර ජයග්‍රහණ අත්කර ගැනීමට උපරිම දායකත්වයක් ලබාදීමේ අරමුණින් මානව කාර්ය සාධන විද්‍යාගාරයක් ස්ථාපිත කර ඇත. ක්‍රීඩා වෛද්‍ය ආයතනය විසින් මෙරට විශ්වවිද්‍යාල හා ක්‍රීඩාව සම්බන්ධ වෙනත් ආයතන සමඟ ඇතිකරලෙන ඇති අවබෝධතා ගිවිසුම් අනුව ක්‍රීඩා හා වෛද්‍ය විද්‍යා පර්යේෂණ සිදුකිරීමට මේ වනවිට ක්‍රියාකර ඇත.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණ

දැක්ම

“ආසියාව තුළ ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යාවේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීම”

මෙහෙවර

“ඉහළ කාර්යසාධන දක්ෂතා ඇති සහ විනෝදාත්මක ක්‍රීඩාවල යෙදෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ඔවුන් හට සේවා සපයන්නන් හට, රෝගාබාධ වැලැක්වීමට, නිවාරණයට, පුනරුත්ථාපනය හා අධ්‍යාපනයට අවශ්‍ය සම්පත්, දැනුම හා මාර්ගෝපදේශ සැපයීම"

අරමුණු

- සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍ය හා කායික යෝග්‍යතාව ඉහළ නැංවීම තුළින් ඔවුන් ජාත්‍යන්තරය තුළ ක්‍රීඩාවෙන් ඉතා ඉහළ මට්ටමකට ගෙන ඒම.
- ක්‍රීඩා විද්‍යාව හා නවීන තාක්ෂණය උපයෝගි කරගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඔවුන් විසින්ම උරුම කරගනු ලැබූ හැකියාවන් වර්ධනය කිරීම සඳහා මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කර ඉන් උපරිම ප්‍රතිඵල මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබාදීම .
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පූර්ව සහභාගිත්ව වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම තුළින් ඔවුන්ගේ ගැටළු හඳුනාගැනීම හා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික යෝග්‍යතාව හා පෝෂණ මට්ටම වරින්වර මැන බැලීම, කායික යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හා පෝෂණ සටහන් ලබා දීම තුළින් කායික යෝග්‍යතාවය සහ පෝෂණය වැඩිදියුණු කිරීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මානසික සෞඛ්‍ය වර්ධනය කරමින් ක්‍රීඩාවට උචිත ජයග්‍රාහී මානසික තත්ත්වයක් ළඟා කරදීමට උපදේශන හා මඟ පෙන්වීම .
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ මට්ටම ක්‍රීඩාවට උචිත පරිදි ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම .
- ක්‍රීඩාවේදි අවශ්‍ය ප්‍රථමාධාර භාවිතය පිළිබඳව පුහුණුකරුවන් හා වෛද්‍ය සහායකයන් දැනුවත් කිරීම සඳහා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශීය හා විදේශීය වශයෙන් පවත්වනු ලබන තරඟාවලි සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රථමාධාර හා වෛද්‍ය ආවරණ සැපයීම.
- ක්‍රීඩා විද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ දෙස් විදෙස් විද්වතුන් සමඟ පර්යේෂණ පැවැත්වීම හා ඒ තුළින් ලබා ගන්නා දැනුමෙන් මෙරට ක්‍රීඩාව උසස් මට්ටමකට ගෙන ඒම.
- ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයට ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේ දැනුම හා මාර්ගෝපදේශ ලබාදීම තුළින් නිරෝගි ප්‍රජාවක් බිහි කිරීම සඳහා දායක වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- ක්‍රීඩා ආබාධ වැළැක්වීම සහ කළමණාකරණය කිරීම සඳහා කටයුතු කිරීම.
- විශේෂඥ වෛද්‍ය සායන පැවැත්වීම.
- කායික යෝග්‍යතා පරීක්ෂණ සිදු කිරීම.
- මානව කාර්යසාධන විද්‍යාගාරය මඟින් ක්‍රීඩකයින්ගේ ජෛව තාක්ෂණය සම්බන්ධව සහ, හෘදය සහ පෙනහළුවල දරා ගැනීමේ හැකියාව සම්බන්ධව පර්යේෂණ කිරීම.
- ක්‍රීඩා පෝෂණ හා ක්‍රීඩා මානසික උපදේශණය.
- ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලි සඳහා වෛද්‍ය හා ප්‍රථමාධාර ආවරණය.
- ක්‍රීඩාව පිළිබඳ අධ්‍යයනය හා පර්යේෂණ සිදු කිරීම.
- විනෝදාත්මක ක්‍රීඩා සඳහා යොමු වූ පුද්ගලයින් සඳහා ක්‍රීඩා හා ව්‍යායාම සම්බන්ධව උපදෙස් සහ වෛද්‍ය පහසුකම් ලබාදීම.
- දෙස් විදෙස් විද්වතුන් හා ආයතන සමඟ ක්‍රීඩාව හා පෝෂණය සම්බන්ධ පර්යේෂණ වෙනුවෙන් අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම.

1.4 සංවිධාන සටහන


SL 3
අධ්‍යක්ෂ ජනරාල් -01
SL 2
වෛද්‍ය නිලධාරී -SLMS 11/111-08
SL 1
නියෝජ්‍ය - සහකාර අධ්‍යක්ෂ/SLAS 11/111-01
01
MN 7
පරිපාලන නිලධාරී -01
MN 5
පෝෂණවේදී 01-
MN 4
පර්යේෂණ නිලධාරී 02 -
සංවර්ධන නිලධාරී 04 -
වැඩසටහන් සහකාර 01 -
MT 7
හෙද නිලධාරී 05 -
MT 6
ඖෂධවේදී -02
වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී-01
01 -
භෞත චිකිත්සක - 02
MN 2
කළමණාකාර සහකාර- 02
MT 1
තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර-01
01 -
PL 1
රසායනාගාර සහායක- 04
උපස්ථායක- 05
කාර්යාල කාර්යය සහායක- 05
PL 2
සම්බාහකවරු-25
PL 3
රියදුරු -06

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල - නැත

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - නැත

2 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය - 2022

- **මානව කාර්යසාධන විද්‍යාගාරයට අයත් ජෛව යාන්ත්‍රණ අංශය ස්ථාපිත කිරීම.**
    - තරඟකාරී ක්‍රීඩාවෙන් ලොව ජය ගැනීමට අවශ්‍ය තාක්ෂණය කඩිනමින් යොදා ගනිමින් උපරිම කාර්යසාධන මට්ටම් කරා ලඟාවීම, ආබාධ පුනරුත්ථාපනය, ආබාධ වලක්වා ගැනීම, පර්යේෂණ තුළින් ලබා ගන්නා දත්ත ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකරුවන් හා ප්‍රවර්ධන කණ්ඩායම් වෙත ලබා දීම වෙනුවෙන් මානව ක්‍රීඩා කාර්යසාධන විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.
    - ඒ අනුව මානව කාර්යසාධන විද්‍යාගාරයේ පුනරුත්ථාපන අංශයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සපයාගෙන අවසන් අතර එම අංශය මේ වන විට එහි සේවාවන් විධිමත් ලෙස පවත්වාගෙන යන අතර ජෛව යාන්ත්‍රණ අංශයේ යන්ත්‍රෝපකරණ සපයාගෙන ස්ථාපනය කිරීමේ හා ඊට අදාල තාක්ෂණික කණ්ඩායම් පුහුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.
    - අප රටේ ජෛව විද්‍යා සමීක්ෂණ පහසුකම් සහිත මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීම ක්‍රීඩාවේ ජාත්‍යාන්තර ජයග්‍රහණ අත්කර ගැනීමට පිටුවහලක් වනවා සේම මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රයේ අධ්‍යයනයන් සඳහා තෝතැන්නක් ද වනු ඇත. එනම් මානව ස්නායු, අස්ථීමය පේෂි වල ක්‍රියාකාරිත්වය හා ක්‍රීඩකයන්ගේ චලන රටාවන් හදුනාගැනීමෙන් ක්‍රීඩාව ආශ්‍රිත පර්යේෂණ පවත්වන්නට විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, ආචාර්යවරුන්ට හා ක්‍රීඩා ප්‍රවර්ධකයින්හට මෙරට දී අවස්ථාව හිමිවේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රීඩා ආබාධ අවම කර ගැනීමටත්, ක්‍රීඩා දක්ෂතා වැඩි දියුණු කර ගැනීමටත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට හැකි වනු ඇත.





- **ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ VO_2 max පරීක්ෂණ පැවැත්වීම**



ක්‍රීඩකයින්ගේ කායික යෝග්‍යතා මට්ටම මැන බැලීම සඳහා නවීන තාක්ෂණය යොදා ගනිමින් සිදු කරන පරීක්ෂණය මෙය වන අතර ක්‍රීඩකයින් පුහුණුවට පෙර පුහුණුකාලයේදී හා තරඟයට පෙර මෙම පරීක්ෂණය සිදු කරමින් ඒ තුළින් ඔවුන්ගේ කායික යෝග්‍යතා මට්ටම මැන බලනු ඇත.

මේ වන විට **VO_2 max** පරීක්ෂණ 130 ක් පමණ සිදුකර ඇති අතර ක්‍රීඩකයින් ඉහළ කාර්යසාධන මට්ටමක් කරා ගෙන යාමට ඒ තුළින් හැකියාව ලැබේ. මෙම පරීක්ෂණ කායික විද්‍යාව සම්බන්ධ විශේෂඥයින් විසින් සිදුකරනු ලැබේ.

- **ස්වේච්ඡා සේවාවක් ඇති කිරීම**

මෙම වසර තුළ ක්‍රීඩා වෛද්‍ය ආයතනය තුළ ස්වේච්ඡා සේවාවක් ඇති කිරීම ද එක් ඉලක්කයක් වූ අතර මේ වන විට එම කාර්යය ඉටු කර ඇත. ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව ඇතුළු ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම බෙදා ගනිමින් හා නවින තාක්ෂණය යොදා ගනිමින් ක්‍රීඩාව දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීමට මෙහිදී හැකිවනු ඇත. ආයතනයේ මානව සම්පත් සීමා වන විෂයයන් වලදී මෙම ස්වේච්ඡා සේවාව කාර්යයන් පහසු කර ගැනීමට මහත් උපකාරයක් වේ.

මේ වන විට ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු වූවන් හා ක්‍රීඩාවට ලැදි ස්වේච්ඡා සේවා සපයන්නන් 250 ක පමණ ප්‍රමාණයක් අයතනය සමඟ එක්ව සිටින අතර නිරන්තර ඔවුන් දැනුවත් කිරීමේ වැඩමුළු හා දැනුම බෙදා ගැනීමේ ක්‍රියාකාරකම් සිදු කරයි.

මේ වන විටත් භෞත චිකිත්සක අංශයේ ස්වේච්ඡා පදනමින් භෞත චිකිත්සකයින් පස් දෙනකු සේවය කරන අතර ක්‍රීඩා මානසික විද්‍යාව සම්බන්ධව උපාධිධාරීන් දෙදෙනකු ද ක්‍රීඩා මානසික කටයුතු සම්බන්ධව සේවයේ යෙදී සිටී.

- **පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

පළාත් මට්ටමින් පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම, නූතන තාක්ෂණික දැනුම ඔවුන්ට අත්පත්කර ගැනීමට අවකාශය සැලසීම, ක්‍රීඩා හා ව්‍යායාම් සම්බන්ධව නිවැරදි තාක්ෂණික දැනුම ලබාදීම සහ අඩු වියදම් තාක්ෂණික උපකරණ සහ ශාරීරික බර උපයෝගීකර ගනිමින් ශක්තිවර්ධනය සහ ශාරීරික යෝග්‍යතාවට සම්බන්ධව දැනුම වැඩි කිරීම සඳහා නූතන තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ දැනුවත් කිරීම මඟින් ක්‍රීඩාවේ ආබාධ අඩුකර ගැනීම, කළමනාකරණය කර ගැනීම සහ දක්ෂතා වර්ධනයට අවශ්‍ය තාක්ෂණික උපදෙස් සැපයීම මේ මඟින් සිදු කරන ලදී. ක්‍රීඩාව සම්බන්ධ මූලික මූලධර්ම සම්බන්ධව දැනුම අඩු වීම හා ක්‍රීඩාවට අවශ්‍ය මූලික ගුණාංග පුහුණු නොකිරීම තුළ පාසල් ක්‍රීඩකයින් ඇතුළු දක්ෂතාවයන් පිරි ක්‍රීඩකයින් ආබාධයන්ට ලක්වීමෙන් ඇති වන අහිතකර තත්වයන් වලක්වා ගැනීමට හා පාලනයට මෙම වැඩසටහන ඉතා වැදගත් වේ.

එහි පළමු අදියර ලෙස මාර්ගගත ක්‍රමයෙන් (ZOOM තාක්ෂණය මඟින්) පළාත් ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා වූ දේශන මාලාව දින 02 ක් ක්‍රීඩා වෛද්‍ය ආයතනයේදී පවත්වන ලදී.

- **ජාත්‍යන්තර තලයේ පර්යේෂණ සිදු කිරීම**

කොවිඩ් රෝගයට ලක්වූ ජාතික තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ශ්වසන හා හෘද යෝග්‍යතාව මැන බැලීම මෙහිදී කළ අතර එය ජාතික වෛද්‍ය පර්යේෂණ ආයතනය හා සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හා එක්ව සිදු කරන ලදී.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් 76 දෙනකු මේ සඳහා යොදා ගත් අතර එය මේ වන විට යුරෝපයේ Pulmonary Association හි ප්‍රකාශයට පත්කර ඇත.

- **ආයතන අතර අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම**

ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවශ්‍ය ජාත්‍යන්තර හා නවීන තාක්ෂණය භාවිතා කිරීම, දැනුම හුවමාරු කර ගැනීම හා ඒ තුළින් ක්‍රීඩා වෛද්‍ය විද්‍යා පර්යේෂණ සිදු කිරීමේ අරමුණින් මේ වනවිට ශ්‍රී ලංකා පෝෂණ සංගමය, වයඹ විශ්වවිද්‍යාලය හා සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම් ඇති කරගෙන ඇත.





- **ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනයට අවශ්‍ය පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම.**

පළාත් මට්ටමින්, ක්‍රීඩා පාසල් සංචිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය වර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භකල අතර දකුණු පළාතේ ක්‍රීඩා පාසල් 03 ක් ඒ තුළින් ආවරණය කරන ලදී. 2023 වර්ෂයේ දී ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.





පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අදාළ ක්‍රීඩාවට අවශ්‍ය ශරීර සංයුතිය පවත්වා ගැනීම, නිසි ශරීර හිමොග්ලොබින් ප්‍රමාණය පවත්වා ගැනීම, ක්ෂුද්‍ර පෝෂක සහ මහා පෝෂක ප්‍රමාණයන් පවත්වා ගැනීම, ක්‍රීඩා පාසල්වල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ පුහුණුකරුවන් පෝෂණ මූලධර්ම පිළිබඳව දැනුවත් කිරීම, ක්‍රීඩා පාසල්වල ආහාර වේල නිසි පෝෂණ ද්‍රව්‍යවලින් පිරි වේලක් බවට පත් කිරීම හා ක්‍රීඩා පාසල්වල සිටින සංචිත ගත ක්‍රීඩකයින්ගේ අනතුරු ආබාධ අවම කිරීම මෙම ව්‍යාපෘතිය තුළින් සිදුවේ.

- **ක්‍රීඩා සම්බාහකයින්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩ සටහන් පැවැත්වීම**

ක්‍රීඩා සම්බාහක හා භෞත චිකිත්සක පාඨමාලා නැවත ආරම්භ කිරීමේ වැඩසටහනෙහි පළමු අදියර ලෙස පුහුණු කරන ලද ක්‍රීඩා සම්බාහකයින්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩමුළුව දින 04ක් ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ දී පැවැත් වූ අතර ඒ සඳහා ක්‍රීඩා සම්බාහකයින් 37 දෙනකු පමණ සහභාගී විය.





2022 වර්ෂයේ දී සපයන ලද සේවාවන්

මාසය	ප්‍රතිකාර සඳහා පැමිණි ගිලන් රථිකාවන්	භදිසි ප්‍රතිකාර අංශය	පුනරුත්තාපන අංශය		කායික යෝග්‍යතා අංශය	වෛද්‍ය ආවරණ		VO2 Max පරීක්ෂණ
			භෞත චිකිත්සක අංශය	සම්බාහන අංශය		දේශීය	විදේශීය	
ජනවාරි	441	189	447	232	106	17	-	
පෙබරවාරි	289	449	294	249	45	15	1	
මාර්තු	374	267	484	319	105	22	2	
අප්‍රේල්	226	221	264	245	106	12	-	
මැයි	199	107	220	93	106	3	1	
ජුනි	296	79	312	232	74	9	-	
ජුලි	128	65	123	179	59	1	1	**119**
අගෝස්තු	407	92	455	486	42	11	3	
සැප්තැම්බර්	370	143	506	462	78	15	2	
ඔක්තෝම්බර්	317	130	509	296	72	24	1	
නොවැම්බර්	440	180	528	384	78	12	1	
දෙසැම්බර්	465	111	589	306	124	5	1	
එකතුව	**3952**	**2033**	**4731**	**3483**	**995**	**146**	**13**	





2.2 අභියෝග

වර්ෂය මුල ලැබී තිබූ ප්‍රතිපාදන සඳහා වැඩසටහන් සැලසුම් කර තිබූ අතර වරින් වර සිදු වූ රාජ්‍ය වියදම් සීමා කිරීම මත එම කටයුතු ද සීමා කිරීමට සිදු වීම දැවැන්ත අභියෝගයක් විය.ඊට අමතරව වසරේ මැද භාගයේ රට තුල පවතී අර්බුධකාරී තත්ත්වය මත සේවය නිසි පරිදි පවත්වාගෙන යාම ද අභියෝගාත්මක කාරණයක් විය.

2.3 අනාගත අරමුණු

- ස්ථාපිත කර ඇති මානව කාර්යසාධන විද්‍යාගාරය මඟින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීම. මානව කාර්ය සාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීමෙන් එහි සියළු පහසුකම් මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබා දීමට ක්‍රියා කිරීම හා සපයා ගන්නා ලද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් ක්‍රීඩාවේ නවීන තාක්ෂණය මෙරට ක්‍රීඩාව නගා සිටුවීම සඳහා යොදා ගැනීම.

- නවීන තාක්ෂණය තවදුරටත් මෙරට ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් යොදා ගැනීම සඳහා ජාත්‍යන්තර දැනුම හුවමාරු කර ගැනීම හා මානව සම්පත් සංවර්ධනය ඒ සඳහා මෙවන විට මෙරට විශ්වවිද්‍යාල දෙකක් හා ශ්‍රී ලංකා පෝෂණ සංගමය සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකරගෙන ඇති අතර ඉදිරියේදී ජාතික හා ජාත්‍යන්තර ආයතන සමඟ තව දුරටත් ගිවිසුම් ගත වීම සඳහා ක්‍රියා කිරීම.

- ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයේ ව්‍යායාම මධ්‍යස්ථාන හා රැකියා වල නියුතු වූවන් සඳහා නියාමන ආයතනයක් ඇති කිරීම.

